# FPA පුවත් සංග්‍රහය

2013 තෙවන කලාපය

fpa SRI LANKA
enriching relationships

60 1953 - 2013

www.fpasrilanka.org


**සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...**

# 9 වැනි පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සම්මේලනයේ දී ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය හා අයිතිවාසිකම් පිළිබඳ අවධානය...




වමේ සිට : කැමරූන් රාජ්‍යය නියෝජනය කළ තරුණ ක්‍රියාකාරිනී ලිලී හරිටෝ මෙනෙවිය, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය, තරුණ බලගැන්වීම් කමිටුවේ සමාජික සහ මෙම සැසිවාරයේ සභාපති නුරානි මුතාලිෆ් මහතා, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත ඇලාන් සිබිනාල මහතා සහ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය භාග්‍ය ජයසිරි මහතා.




අධිවාචන සහ HIV ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය සභාව අමතමින්...


**එක් සත්‍ය කතාවක් ...**
3 පිටුව


**9 වැනි පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සම්මේලනයේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය හා අයිතිවාසිකම් පිළිබඳ සැසිවාරයේදී ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය හා HIV ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය විසින් දේශන පවත්වන ලදී.**

මේ අවස්ථාවට පොදුරාජ්‍ය මණ්ඩලයීය තරුණ නියෝජිතයින් 102ක් සහ ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ නියෝජිතයින් ඇතුළු තරුණ නියෝජිතයින් 20ක් ද දේශිය හා ජාත්‍යන්තර නිරීක්ෂණ කණ්ඩායම්ද එක්ව සිටියහ.

මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති මෙම සැසිවාරය සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රි තිලංග සුමතිපාල මහතා, අධ්‍යාපන නියෝජ්‍ය ඇමති මොහොන් ලාල් ග්‍රේරු මහතා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත වෛද්‍ය ෆර්දෝසි රස්තම් මේතා (Dr. Firdosi Rusthem Metha) මහතා, UNFPA ශ්‍රී ලංකා නියෝජිත ඇලාන් සිබිනාල (Mr. Alain Sibenale) මහතා සහභාගි වූහ.

## ඌව පළාතේ තරුණ තරුණියන් දැනුවත් කිරීම



ඌව පළාතේ තරුණ තරුණියන් පිරිසක් තරුණයන් සඳහා වූ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා පැවති වැඩසටහනකට එක්වෙමින්...

## UNFPA ශ්‍රී ලංකා නියෝජිතවරියට අපගේ ප්‍රණාමය




එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) ශ්‍රී ලංකා නියෝජිත ලිනෙ ක්‍රිස්ටියන්සන් මහත්මිය (Ms. Lene Christiansen) සිය සේවා කාලය නිමා කර නික්මයාම නිමිත්තෙන්, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ප්‍රණාමය පිරිනැමීම සඳහා හමුවක් පැවැත්වූ අවස්ථාව. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය සභාව අමතමින්.

## පවුල් සැලසුම් උපකරණ පිළිබඳ නවතම තොරතුරු ලබාදීම.

පවුල් සැලසුම් උපකරණ පිළිබඳ නවතම තොරතුරු ලබාදීමේ වැඩසටහනක් මීගමුවේදී පැවැත්විය. මේ සඳහා එම ප්‍රදේශයේ වෛද්‍යවරු රැසක් සහභාගී වූහ. වයඹ ස්වාධීන වෛද්‍යවරුන්ගේ සංගමය සහ ශ්‍රී පවුල් සංවිධාන සංගමයේ අලෙවි ඒකකය විසින් මෙය සංවිධානය කරන ලදි.




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය එහිදී සිය දේශනය පවත්වමින්....

## ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට ප්‍රජනක සෞඛ්‍ය දැනුම



යුධ, නාවික, ගුවන්, හමුදා සෞඛ්‍ය උපදේශකවරුන් වෙත ප්‍රජනක සෞඛ්‍ය දැනුම ලබාදීම සඳහා ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ජාතික වැඩසටහනේ මෙහෙයවීම යටතේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක වේ. ප්‍රජා වෛද්‍ය විශේෂඥ ජානකී විදානපතිරණ මහත්මිය විසින් එම වැඩසටහන මෙහෙයවන අවස්ථාවක්... අධිචාවන හා HIV ඒකකයේ එම්. පී. ටී. මහේෂ්කුමාර මහතා විසින් මෙහි සම්බන්ධීකරණය සිදුකරන ලදි.

## එක් සත්‍යය කතාවක්...

## වළපනේ පොඩිමැණිකා මහත්මියගේ කථාව

පොඩිමැණිකේ දරුවන් 8 දෙනෙකුගේ මවකි; ගෘහණියකි. පොඩිමැණිකේ පදිංචිව සිටින්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වළපනේ ප්‍රදේශයේ උඩුපුස්සැල්ලාව වතුයායේය. මෙම සිද්ධිය වන විට පොඩිමැණිකේගේ වයස අවුරුදු 58කි.

ඇයට බඩ රිදීමක්, වේදනාවක් ටිකෙන් ටික ඇතිවුනා... ඒ එක්කම ලිංග ප්‍රදේශයේ යම් ප්‍රමාණයක් රුධිරය පිටවීමක් දක්නට තිබුණා. ඩිම්බහරණයෙන් පසු එවැනි රුධිර පිටවීමක් සිදුවීම සාමාන්‍ය තත්ත්වයන් නොවන බව පොඩිමැණිකේ දැනගෙන සිටියත්, එතරම් තද වේදනාවක් නොතිබුණු බැවින් ඒ ගැන එතරම් සැලකිල්ලක් දැක්වුයේ නැත. කෙසේ වෙතත් වෛද්‍යවරයෙකු මුණගැසීමට නම් තම නිවසේ සිට ඇය කිලෝමීටර 23ක් පමණ දුර ගෙවා වෛද්‍ය මධ්‍යස්ථානයකට යා යුතුය. දුෂ්කර ප්‍රවාහන සේවාවක් ඇති ඒම ප්‍රදේශයේ මෙම ගමන යාමට පැය 4ක පමණ කාලයක්වත් ඇයට ගතවනු ඇත. එසේම සවස 3ට පෙර කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වුවහොත් ගමට ඒමට ඇති අවසන් බසයත් මග හැරෙනු ඇත.

මෙවැනි කාරණා නිසා ඇය වෛද්‍යවරයෙකු මුණගැසීමේ අදහස ගැන එතරම් සිතුවේ නැත. ඇය ගෙදර දොරේ කරගත හැකිවූ ප්‍රතිකර්ම කිහිපයක් කරගත්තේය. එහෙත් ඵලක් නොවීය.

දිනක් පොඩි මැණිකේ ගමේ මහජන සෞඛ්‍ය පරීක්ෂිකාවකට තමන්ගේ තත්ත්වය කීවාය. මෙය පොඩි මැණිකේ සිතන තරම් සරල දෙයක් නොවන බව ඇයට වැටහුණි. ඇයට වාසනාවකට මෙන් මතක් වූයේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය කිට්ටුම දිනක රාගල ප්‍රදේශයේ පවත්වන ජංගම වෛද්‍ය සායනයයි. ඇය පොඩිමැණිකේට ඊට සහභාගී වන ලෙස උපදෙස් දුන්නාය. එම වෛද්‍ය සායනයේදී පොඩිමැණිකේ පැප්ස්මියර් පරීක්ෂාවකට ලක්විය. මෙම පරීක්ෂාවේ ප්‍රතිඵලයක් ලෙස ගැබ්ගෙල පිළිකාවක අවධානය ඇති බව හඳුනාගැනීමට හැකිවිය. නුවරඑළිය සුව සේවා මධ්‍යස්ථානය ඇයව නුවරඑළිය මහ රෝහල වෙත යොමු කළේය. නුවරඑළිය රෝහලේ කළ පරීක්ෂාවන්ගෙන් පසුව ශල්‍යකර්මයක් සිදුකළේය. දින 03ක් රෝහල් ගතව සිට ඇය නැවත නිවසට ගියාය.

පොඩිමැණිකේගේ ජීවිතය සුරක ගැනීමට සැමට හැකිවිය. පොඩිමැණිකේ සැමට තුති පුදන්නේය.....

**ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ඇගයීම් සහ නියාමන ඒකකයේ සිද්ධි අධ්‍යයන වාර්තාවකින් උපුටාගන්නා ලද්දකි.**

# ලෝක ඒඩ්ස් දින වැඩසටහන්

දෙසැම්බර් 01 වනදා මෙවර ලෝක ඒඩ්ස් දිනය නිමිත්තෙන් ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ජාතික වැඩසටහන සංවිධානය කළ පා ගමන සහ ජාතික වැඩසටහන සඳහා දායකත්වය ලබා දීමට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයට මෙවරද අවස්ථාව උදාවිය.

දෙසැම්බර් 01 වනදා ජාතික බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා එක්ව HIV ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ පාගමනක් පැවැත්වූ අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ගරු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ලලිත් දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික වැඩසටහන පැවැත්විය.

පහත දැක්වෙන්නේ එම අවස්ථාන්හි ඡායාරූපයන් කිහිපයකි...












**HIV ගැන දැනගනි**

## ලිලී (Lili) ව්‍යාපෘතියේ වැඩසටහන්

ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ගේ සෞඛ්‍ය තත්වයන් නංවාලීම ඉලක්ක කරගෙන ක්‍රියාත්මක වන ලිලී ව්‍යාපෘතියේ වැඩසටහන් සහ වෛද්‍ය සායන ගණනාවක් පසුගිය මාස කිහිපය තුළ ස්ථාන ගණනාවකදී ක්‍රියාත්මක විය. කළමනාකාරිනී සුනීතා රත්නායක මහත්මිය විසින් ශ්‍රී ලංකා යුධහමුදා සේවා වනිතා ඒකකයේ සහයෝගය ද ඇතිව මෙම වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.







ශ්‍රී ලංකා යුධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මහත්මිය (වම් කෙලවරේ) ඇතුළු පිරිස වෛද්‍ය සායනයේ කටයුතු පිරික්සමින්...










## මොණරාගල දිස්ත්‍රික් මාධ්‍ය වැඩමුළුව

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ HIV අතර පවත්නා සම්බන්ධතාවන් සවිබල ගැන්වීම සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් මොණරාගලදී පවත්වන ලදි. යුරෝපා හවුල අනුග්‍රහයෙන් පවුල් සංවිධාන සංගමය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මාතර ප්‍රතිභා මාධ්‍ය ජාලය මගින් මෙහි සංවිධාන කටයුතු සම්බන්ධීකරනය කරන ලදි.



ඡායාරූපයේ වමේ සිට ඉදිරිපෙළ
ව්‍යාපෘති තාක්ෂණික කමිටුවේ ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ මහත්මිය, වෛද්‍ය එම්. ජේ. එම් නවුෆල් මහතා, ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ජාතික වැඩසටහනේ විශේෂඥ වෛද්‍ය කුලසිරි බුද්ධකෝරාල මහතා, අධිවාචන හා HIV ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය, ගෝලීය අරමුදල් ගණකාධිකාරී සතිෂ් ඉලංකො මහතා.

පසු පෙළ - සහභාගී වූ මාධ්‍යවේදීන් පිරිස





මු - ආරක්ෂා වෙමු

## කාර්ය මණ්ඩලය දැනුවත් කරමින්



විශේෂඥ වෛද්‍ය ලසන්ත මලවිගේ මහතා පවුල් සංවිධාන සංගමයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා දේශනයක් පවත්වමින්...

මානව සම්පත් අංශය මගින් මෙය සංවිධානය කරන ලදි.

## අලෙවි නියෝජිත හමුවීම්

ප්‍රීති, ස්ටැමින, මිතුරි, පොස්ටිනෝ ආදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වෙළඳනාමයන් යටතේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සුවිසල් බෙදා හැරීම් ජාලය හා එක්ව සිටින දිවයින පුරා අලෙවි නියෝජිත පිරිස් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් හමුවීම් ගණනාවක් පසුගිය මාස කිහිපය තුළ පැවැත්විය. සමාජ අලෙවිකරණ ඒකකයේ අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම හමුවීම් පැවැත්වේ.


නුවර


මාතර



**පළමු පිටුවෙන්.....**

### 9 වැනි පොදු රාජ්‍ය මණ්ඩලයීය ...

තරුණ සම්මේලනයට සමගාමීව තවත් විශේෂ වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයට අවස්ථාවක් උදාවිය. මෙහිදී වසර 2020 දී ලෝකය තුළ සැමට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් යන තේමාව යටතේ ජාත්‍යන්තර සහ දේශීය තරුණ නියෝජිතයින් සමඟ සාකච්ඡා සහ සංවාද පැවැත්වුනි. විශේෂයෙන්ම ඒකපුද්ගල රංගනයන් තුළින් තේමාවට අනුව ඉදිරිපත් කිරීම්ද සිදුවිය.




## ප්‍රියන්තිගේ ප්‍රාර්ථනා ඉටු වූ පසු....

රත්මලානේ ඩබ්. ජී. ප්‍රියන්ති මහත්මිය වසර ගණනක්
දරු සුරතල් බලන්නට පෙරුම් පෙරුවාය.
එහෙත් එය ඉටු වූයේ නැත.
අවසානයේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයට
ඇය සිය ස්වාමිපුරුෂයා සමඟ පැමිණියේ ඒ සඳහා
උපදෙසක් ලබාගැනීමටය. දිගින් දිගටම පවුල්
සංවිධාන සංගමයේ උපදෙස්, ඇය පිළිපැදීය.
පසුගිය දිනක ඇගේ දරු සිඟිත්තිය සමඟ
පවුල් සංවිධාන සංගමයට පැමිණියේ සිය
කෘතඥතාව එළකිරීමටය.....
වසර ගණනාවක් ඇය කළ ප්‍රාර්ථනාව
පවුල් සංවිධාන සංගමයේ මඟපෙන්වීමෙන්
සාර්ථක කර ගැනීමට ඇයට හැකි වූවාය.
**අපගේ සුබ පැතුම් !**

# FPA පුවත් සංග්‍රහය

2013 තෙවන කලාපය

www.fpasrilanka.org

සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...


**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**


37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org


## සුහද හමුවේ චමත්කාරය

පවුල් සංවිධාන සංගමයේ සුහද හමුව මෙවර කොළඹ 07 බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා පිටියේදී පැවැත්විය. චමත්කාරය පිරුණු එම සුහද හමුවේ අවස්ථා කිහිපයක්....




## දකුණු ආසියා කලාපීය තරුණ හමුව

## අපේ සිරුර - අපේ අයිතිය

දකුණු ආසියා කලාපීය තරුණ හමුව පසුගිය අගෝස්තු මාසයේ දී දින තුනක් පුරා තායිලන්තයේ බැංකොක් නුවර දී පැවැත්විය. සැලසුම් කළ මාපියභාවය පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනයේ දකුණු ආසියා කලාපීය කාර්යාලය මෙය සංවිධානය කරන ලදි.

රටවල් 10ක් නියෝජනය කරමින් 30 දෙනෙකු පමණ තරුණ තරුණියන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. **අපේ සිරුර - අපේ අයිතිය** යන තේමාව යටතේ මෙම හමුව පැවැත්විය. අවුරුදු 15 - 24 අතර ශිෂ්‍යයින්, තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීන්, මාධ්‍යවේදීන්, තරුණ ක්‍රියාකාරීන්, විවිධ කලාවේදීන්, HIV සමඟ ජීවත් වන්නන් ආදී පිරිස් මේ අතර වූහ.

ICPD සහ MDGs ඉලක්කයන් සපුරාගැනීමෙන් අනතුරුව වසර 2015න් පසු ඒවායේ ක්‍රියාත්මකභාවයන් සඳහා අවශ්‍ය අධිවාචන සැලසුම සකස්කිරීම මෙම හමුවේදී සිදුවිය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, සෙනෙල් වන්නිආරච්චි (යොවුන් පාර්ලිමේන්තුව හා මාධ්‍යවේදී), චමත්‍යා ප්‍රනාන්දු (ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය) භූමි ද සිල්වා (Equal Ground) සහ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය උපදේශකවරියක් ලෙසද මෙම අවස්ථාවට එක්වූහ.





සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය